මගේ අංකය: JSC/SEC/CIR- L/2023

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 14/2023**

සියලුම මහේස්ත්‍රාත්වරුන් හා අතිරේක මහේස්ත්‍රාත්වරුන් වෙත,

**<u>බන්ධනාගාර තුළ සිටිනා වයස අවුරුදු 16-18 අතර පසුවන ළමා සැකකරුවන් හා ළමා වරදකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම.</u>**

ශීර්ෂගත කරුණට අදාළව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් නාමල් ලියනගේ මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ද පිටපතක් සහිතව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද අංක: **PCC/4/6/3/2017 - II** ලිපියක් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එකී ලිපියේ 07 ඡේදය ඔබගේ අවධානයට ලක් කරන ලෙස මට නියම කර ඇත. {ළමයාගේ උපරිම සුභසිද්ධිය ( Best interest of the child ) යන නීතිමය සිද්ධාන්තයට අදාලව}

02. ඒ අනුව **PCC/4/6/3/2017 - II** අංක දරණ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එහි 07 වන ඡේදය ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 මැයි මස 25 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
நன்னடத்தைமற்றும் சிறுவர் பராமரிப்புசேவைகள் திணைக்களம்
DEPARTMENT OF PROBATION AND CHILD CARE SERVICES
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

04 MAY 2023

මගේ අංකය / எனது இல. — PCC/4/6/3/2017 - II
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date — 2023.04.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**බන්ධනාගාර තුළ සිටිනා වයස අවුරුදු 16-18 අතර පසුවන ළමා සැකකරුවන් හා ළමා වරදකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම**

උක්ත කරුණ යටතේ 2023.04.18 දින කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්තුමිගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීම හා සම්බන්ධවයි. එදින රැස්වීම් වාර්ථාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02.දැනට බන්ධනාගාර තුළ සිටිනා ළමා සැකකරුවන් හා ළමා වරදකරුවන්ගේ සවිස්තරාත්මක තොරතුරු ලබා ගෙන බන්ධනාගාර පරිශ්‍රයෙන් එකී ළමුන් ඉවත් කිරීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවට ඉහත රැස්වීමේදී සාකච්ඡා කරන ලදී.

03.මෙම රැස්වීමේදී බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දැනට බන්ධනාගාරගතව සිටිනා ළමුන් සම්බන්ධයෙන් සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන ලද අතර එකී තොරතුරුවලට අනුව පහත තත්ත්වයන් අනාවරණය විය.

| | |
|---|---|
| 2023.04.06 දින වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ සිටින වයස අවුරුදු 16-18 මුළු ළමුන් සංඛ්‍යාව | 37 |
| එකී ළමුන් 37 අතුරින් රැඳවුම් නියෝග මත සිටින ළමුන් සංඛ්‍යාව | 25 |
| වරදකරුවන් වීමෙන් පසු සිරගත කර ඇති ළමුන් සංඛ්‍යාව | 12 |
| ඇප අපේක්ෂාවෙන් සිටින ළමුන් සංඛ්‍යාව | 29 |
| ඇප ගෙවා ගැනීමට නොහැකිව සිටින ළමුන් සංඛ්‍යාව | 8 |
| මහාධිකරණයට ඇප ඉදිරිපත් කිරීමට නොහැකිව සිටින ළමුන් සංඛ්‍යාව | 3 |

04.තවද ඉහත තොරතුරුවලට අමතරව මෙම ළමුන් සම්බන්ධයෙන් පහත කරුණුද අනාවරණය විය.

- ළමුන් වෙනුවෙන් ඇප තැබීමට කිසිවෙකු නොමැති වීම
- මහාධිකරණයට ඇප අයදුම්පත යොමු කිරීමට මුදල් නොමැතිවීම
- රසපරීක්ෂක වාර්තාව ප්‍රමාද වීම

බී කොටස, 03 වන මහල , සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பீ"பிரிவு,03ம் மாடி,ஐஐம் தொகுதி,செத்சிரிபாய,பத்தரமுல்லை, இலங்கை.
WingB, 03rd Floor, Sethsiripaya Stage II,Battaramulla, Sri Lanka
විද්‍යුත් තැපැල/மின்னஞ்சல் /E-mail: pcc@sltnet.lk
වෙබ්/இணையம;/ Web : www.probation.gov.lk
කාර්යාලය/காரியாலயம் /Office :0112186062
ෆැක්ස්/ தொலைநகல்/Fax : 011 2187285/ 011 2186065

05.ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ නව සංශෝධන අනුව ළමයා යන්න වයස අවුරුදු 18 දක්වා වැඩි කර ඇත. එසේ වුවත් මෙම නීතිය බලාත්මකවීමේ දිනය නැවත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම කළ යුතු බව එම නීතියේ සඳහන් වේ. ඉදිරියේදී සිදු කිරීමට නියමිත සංශෝධනයන් අනුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු මට්ටමින් මෙම ළමුන් භාර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු වේ. එසේම අත්‍යවශ්‍යම විටෙක අවසාන විකල්පය ලෙස ළමුන් ළමා සුරැකුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීම කළ යුතු අතර මෙම ළමුන් හැකි සෑම විටම පවුල් පාදක රැකරණයට පත් කිරීමට අප උත්සහ ගනිමින් සිටියි.

06.2018 වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන ජිනිවා කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශවලට අනුව මෙම ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත සංශෝධනය නොවීම මෙන්ම බන්ධනාගාර තුල වයස අවුරුදු 16-18 අතර ළමයින් රැඳවීම පිළිබඳව විමසා ඇත.එබැවින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රජය විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇති බව පෙනී යයි. ඒ අනුව බන්ධනාගාර තුළ සිටිනා වයස අවුරුදු 16-18 අතර ළමුන් හැකි ඉක්මනින් බන්ධනාගාර පරිශ්‍රයෙන් ඉවත් කිරීමත් අළුතින් ළමුන් ඇතුළු කිරීම අවම කිරීමට හා නව නීතිය සම්මතවීමත් සමඟ ඒ සඳහා සූදානම් වීමට යම් කිසි කාලයක් ගත වන බැවින් ඒ සඳහා කල් ඇතිව අධ්‍යනය කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ.

07.නව නීතිය සම්මත වන තෙක් ඉදිරියේදී බන්ධනාගාරවලට ඇතුළු කිරීමට නියමිත වයස අවුරුදු 16-18 අතර ළමුන් සම්බන්ධයෙන් ද පියවර ගත යුතු බැවින්, වයස අවුරුදු 16-18 අතරේ පසුවන ළමා සැකකරුවෙකු/ ළමා වරදකරුවෙකු අධිකරණ නියෝග මත බන්ධනාගාර වෙත යොමු කරනු ලබන අවස්ථාවේදී අධිකරණ විසින් එම ළමයා පිළිබඳව ද අදාළ පරිවාස නිලධාරී දැනුවත් කොට ළමයා සම්බන්ධයෙන් මැදිහත්වීමට පරිවාස නිලධාරීගේ සහාය ලබා ගන්නා ලෙසට අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් සියළුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන යහපත් හා කඩිනම් ප්‍රතිචාරය ඉතා අගය කොට සලකමි.

නාමල් ලියනගේ
කොමසාරිස්

පිටපත්:

01. ලේකම්, කාන්තා, ළමා කටුයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
02. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස
03. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස සහ අ.කා.ස
04. සියළුම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් වෙත - කරු.දැ.ගැ.ස